<u>මුදල් කොමිෂන් සභාවේ කාර්යසාධනය</u>

(2018 ජනවාරි මස 01 දින සිට 2018 දෙසැම්බර් 31 දක්වා)

මුදල් කොමිෂන් සභාව ව්‍යවස්ථානුකූල විධිවිධානයන්ට අනුකූලව කාර්යයන් ඉටු කරයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ 154 (ජ) වගන්තියට අනුකූලව මුදල් කොමිෂන් සභාවේ කාර්යයන් හා වගකීම් ස්ථාපිත කර ඇත.

මෙම වාර්තාව මගින් 2018 ජනවාරි මස 01 වන දින සිට 2018 දෙසැම්බර් මස 31 වන දින දක්වා මුදල් කොමිෂන් සභාව විසින් සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් ආවරණය කෙරේ.

1. 2019 වර්ෂය සඳහා නිර්දේශ

තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ළඟා කර ගැනීම සඳහා පළාත් නවය අතර අරමුදල් බෙදා වෙන් කිරීම පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම හා පළාත්වල අවශ්‍යතා සපුරාලීම සඳහා වාර්ෂික අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම මුදල් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යයන් ගෙන් එකක් වේ.

2019 මුල්‍ය වර්ෂයේ පළාත් සභා සඳහා අයවැය වෙන් කිරීම පිළිබඳව රජය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම පළාත්වල අවශ්‍යතා අනුව ක්‍රමවත්ව සකස් කරන ලදී. 2019 වර්ෂය සඳහා පළාත් නවය අතර ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් සඳහා අරමුදල් බෙදා වෙන් කිරීමේ නිර්දේශ භාෂා තුනෙන්ම සකස් කර 2018 සැප්තැම්බර් මස 29 වන දින අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලදී.

නිර්දේශයන් පිළිබඳව ඉදිරිපත් කරන ලද සවිස්තරාත්මක වාර්තාවෙහි ශ්‍රී ලංකාවේ සමබර හා කලාපීය සංවර්ධනයක් කෙරෙහි අවධානය යොමු කිරීම සහ ඵලදායීව ක්‍රියාත්මක කිරීම පිළිබඳ යෝජිත ප්‍රතිපත්තීන් සවිස්තරාත්මකව ඇතුළත් කර ඇත.

2. පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සමාලෝචනය හා එකගතාවය ලබාදීම සඳහා පළාත් වල සංචාරය කිරීම

2018 වර්ෂයේ දී, මුදල් කොමිෂන් සභාවේ සභාපති, ලේකම් හා අදාල අනෙකුත් නිලධාරීන් සංවර්ධන සැලසුම් විමර්ශනය හා දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති නිරීක්ෂණය කිරීම සඳහා පළාත්වල සංචාරය කරන ලදී. එම රැස්වීම් සඳහා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු හා ආයතනවල ප්‍රධානීන් ඇතුළත්ව අනෙකුත් වගකිව යුතු නිලධාරීන් සහභාගීවන ලදී.

2018 වර්ෂය සඳහා පළාත් සභාවල වාර්ෂික සංවර්ධන සැලසුම් සමාලෝචනය කරන ලද අතර, එහිදී එකඟ වූ පරිදි ඇතැම් සංශෝධන වලට යටත්ව සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් කොමිෂන් සභාව විසින් පළාත් වාර්ෂික සැලසුම් සඳහා එකඟතාව ලබා දී ඇත.

3. වර්ෂය සඳහා පුනරාවර්තන හා ප්‍රාග්ධන අවශ්‍යතා පිළිබඳ අයවැය මාර්ගෝපදේශ නිකුත් කිරීම

මුදල් කොමිෂන් සභාව විසින් පුනරාවර්තන හා ප්‍රාග්ධන ක්‍රියාකාරකම් වල අවශ්‍යතාවයන් තක්සේරු කිරීම සම්බන්ධයෙන් පළාත් සභා බලධාරීන් වෙත වාර්ෂිකව මාර්ගෝපදේශ නිකුත් කරනු ලබයි. එමෙන්ම, 2019 වර්ෂය සඳහා අවශ්‍යතා තක්සේරුව සම්බන්ධව මාර්ගෝපදේශ හා ඇමුණුම් සමග පළාත් ප්‍රධාන ලේකම් වරුන් වෙත යවන ලදී.

පළාත් අවශ්‍යතා තක්සේරු කර මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම සඳහා නිශ්චිත ආකෘති පත්‍ර සහිතව මෙම සවිස්තරාත්මක මාර්ගෝපදේශ සකස් කර යවන ලදී.

4. මුදල් කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තා - 2016 සහ 2017

මුදල් කොමිෂන් සභාවේ 2016 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන් ම මුද්‍රණය කර 2018 පෙබරවාරි මස 15 වන දින ජනාධිපති ලේකම් කාර්යාලයේදී, අතිගරු ජනාධිපතිතුමා වෙත නිල වශයෙන් පිළිගන්වන ලදී.

2017 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන් මුද්‍රණය කර 2018 දෙසැම්බර් මස 05 වන දින අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කර ඇත.

5. උපායමාර්ගික සැලැස්ම සමාලෝචනය කිරීම

සංවිධානයක උපායමාර්ගික සැලැස්ම ආයතනික අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා භාවිතා කරනු ලබන කාර්යක්ෂම මාර්ගෝපදේශයක් වේ. එසේ හෙයින්, මුදල් කොමිෂන් සභාව සඳහා උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීම සඳහා මුදල් කොමිෂන් සභාව පියවර ගෙන තිබේ. මුදල් කොමිෂන් සභාව වෙත පැවරී ඇති කාර්යයන්ට අනුකූලව එක් එක් ප්‍රමුඛතා පරාසයන් යටතේ ඉලක්ක හා පරමාර්ථ ඇතුලත්ව මුදල් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ ක්‍රියාකාරී සහභාගීත්වයෙන් උපාය මාර්ගික සැලැස්මක් කෙටුම්පත් කර ඇත.

මෙසේ සකස් කරගන්නා ලද උපාය මාර්ගික සැලැසුමෙහි කෙටුම්පත කොමිෂන් සභා රැස්වීමේ දී ඉදිරිපත් කරන ලදී. එහිදී, උපාය මාර්ගික සැලැසුම තවදුරටත් වැඩිදියුණු කිරීමට යටත්ව අනුමැතිය ලබා දී ඇත. මෙම උපාය මාර්ගික සැලැස්ම තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයේ අදහස් ලබා ගැනීමට පියවර ගෙන ඇත.

6. 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම

2018 වර්ෂය තුළදී මුදල් කොමිෂන් සභා ලේකම් කාර්යාලය විසින් සිදු කිරීමට නියමිත සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ කාලරාමුව ඇතුළත් විස්තරාත්මක ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලදී. 2017-2020 උපාය මාර්ගික සැලැස්ම මඟින් ලඟාකර ගැනීමට බලාපොරොත්තුවන අපේක්ෂාවන් හා ඉලක්කයන්ට අනුකූලව 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත.

7. පළාත් විගණන වාර්තා පිළිබඳ වාර්තා සැකසීම

විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද පළාත් විගණන වාර්තා මුදල් කොමිෂන් සභාව විසින් අධ්‍යයනය කරන ලද අතර, එම විගණන වාර්තා වලින් ලබාගන්නා නිරීක්ෂණයන් පළාත් සභාවේ වගවීම වැඩිදියුණු කිරීම සඳහා අදාල පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන් වෙත යවා ඇත.

8. මුදල් කොමිෂන් සභාව සඳහා නව ගොඩනැගිල්ල ඉදිකිරීම

මුදල් කොමිෂන් සභාව සඳහා ඉදිකරන කරන ලද නව කාර්යාල ගොඩනැගිල්ල රුපියල් මිලියන 442 ක පිරිවැයකින් යුතුව නිම කරන ලදී. 2018 අගෝස්තු මස 15 වන දින සිට මුදල් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය නව ගොඩනැගිල්ලේ කාර්යාල කටයුතු පවත්වාගෙන යාම ආරම්භ කරන ලදී.

9. මුදල් කොමිෂන් සභාවේ දත්ත පද්ධතිය හා කළමනාකරණ තොරතුරු පද්ධතිය

ආසියා පදනමේ මූල්‍ය සහයෝගීත්වයෙන් මුදල් කොමිෂන් සභාව සඳහා දත්ත පද්ධතියක් සහ කළමනාකරණ තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීම සඳහා ආසියා පදනම හා මුදල් කොමිෂන් සභාව අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

ඒ අනුව කොළඹ විශ්ව විද්‍යාලයේ නියමය පරිදි "තීක්ෂණ" නම් වූ මෘදුකාංග සංවර්ධන පුද්ගලික සමාගම ආසියානු පදනම විසින් මෙම මෘදුකාංග සංවර්ධනය සඳහා සේවා සැපයුම්කරුවෙකු ලෙස තෝරාගනු ලැබීය. තව දුරටත්, වර්තමාන පද්ධතීන් අධ්‍යයනය කිරීම හා නව පද්ධතියේ අවශ්‍යතා පිළිබඳ සාකච්ඡා මාලාවක් පවත්වන ලදී. පුනරාවර්තන වියදම් සඳහා වූ කළමනාකරණ තොරතුරු පද්ධතිය කඩිනමින් ආරම්භ කිරීමටත්, ඉන් පසුව ප්‍රාග්ධන හා ආදායම් පද්ධතිය සඳහා වූ කළමනාකරණ තොරතුරු පද්ධතීන් සංවර්ධනය කිරීම ආරම්භ කිරීමටත් තීරණය විය. පුනරාවර්තන වියදම් සඳහා වූ පද්ධති සංවර්ධනය මුදල් කොමිෂන් සභාවේ දායකත්වය ඇතිව ආරම්භ කරන ලදී.

10. මුදල් කොමිෂන් සභා පනත් කෙටුම්පත

මුදල් කොමිෂන් සභාව පනතක් නොමැතිව ක්‍රියාත්මක වෙමින් පැවති ආයතයක් වන අතර, එයට අදාළ කාර්ය පටිපාටි නොමැතිව කටයුතු පවත්වාගෙන යාම ඉතා අසීරු කාර්යක් වී ඇත.

එසේ හෙයින්, මුදල් කොමිෂන් සභා පනත් කෙටුම්පත සකස් කර අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කර ඇත. ජනාධිපති ලේකම්වරයා විසින් ලබාදුන් නිරීක්ෂණයන් සැලකිල්ලට ගෙන මුදල් කොමිෂන් සභාව දැනටමත් එයට ප්‍රතිචාර දක්වා ඇති අතර ඊට සමගාමීව අතිගරු ජනාධිපතිතුමා විසින් මෙහි ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා 2018 ජනවාරි මස 02 වන දින කැබිනට් පත්‍රිකාවක් මගින් නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කර ඇති බව දැනුම් දී තිබේ. 2018 ජුනි මස 26 වන දින නීතිපතිවරයා විසින් මූලික කෙටුම්පත කොමිෂන් සභාව

වෙත නිරීක්ෂණයන් සඳහා එවා ඇත. ඒ අනුව, මුදල් කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු සලකා බැලීම සඳහා නීති කෙටුම්පත් සම්පාදකවරයා වෙත ඉදිරිපත් කරන ලද අතර, 2018 ඔක්තෝම්බර් මස 18 වන දින එම බිල්පත නීතිපති දෙපාර්තමේන්තුවෙන් ලැබිණි. එය 2018 ඔක්තෝබර් මස 26 වන දින නැවත නීතිපතිවරයා වෙත යොමු කරනු ලැබිය.

11. නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය

11.1. දේශීය පුහුණු

පහත දැක්වෙන තෝරාගත් ක්ෂේත්‍රයන්හි පුහුණුවීම් ලබා ගැනීම සඳහා මුදල් කොමිෂන් සභාවේ නිලධාරීන් හට අවසවථාවන් සලසා දෙන ලදී.

- ✓ පරිගණක මෙහෙයුම් බලපත්‍රය
- ✓ උපයන විට බදු (PAYE) සහ රඳවුම් බදු
- ✓ පරිගණක යෙදවුම්
- ✓ ධාරිතා සංවර්ධන වැඩසටහන
- ✓ කම්කරු නීතිය (සාප්පු හා කාර්යාල පනත, පාරිතෝෂිත, සේ. අ. අ. හා සේ. භා. අ. ආදිය)
- ✓ රියදුරන් දැනුවත් කිරීමේ වැඩසටහන

11.2. විදේශීය පුහුණු

පහත සඳහන් නිලධාරීන් සති දෙකක කෙටි කාලීන විදේශ පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වූහ.

තනතුර	පුහුණු වූ ක්ෂේත්‍රය	පවත්වන ලද රට
ලේකම්	මධ්‍යම ආදායම්ලාභී රටවල තිරසාර සංවර්ධනය; කොරියානු අත්දැකීම් හා ක්‍රියාවන්	කොරියාව
ප්‍රධාන ගණකාධිකාරී	රාජ්‍ය ප්‍රසම්පාදනය	ජපානය
සහකාර අධ්‍යක්‍ෂ	කොන්ත්‍රාත් පරිපාලනය	ඉන්දියාව

11.3. ආරාධිත දේශන

මුදල් කොමිෂන් සභාව විසින් සිය කාර්ය මණ්ඩලය සඳහා නිතිපතා ආරධිත දේශනයන් සංවිධානය කර ඇති අතර ඒ මගින් ධාරිතාවය වැඩිදියුණු කිරීම හා ඔවුන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ දැනුම යාවත්කාලීන කිරීමට අවස්ථාව සලසා දී ඇත. පහත සඳහන් ආරාධිත දේශකයන් මුදල් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සඳහා විවිධ මාතෘකා ඔස්සේ ඉදිරිපත් කර ඇත.

නම	මාතෘකාව
මහාචාර්ය සිරි හෙට්ටිගේ මහතා සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය	Vision 2025
ඩී. එන්. එස්. කුරුප්පුමුල්ලගේ මහතා - ප්‍රධාන විධායක නිලධාරී සහ අධ්‍යක්ෂ Ind-expo of Certification Institute සහ හිටපු අධ්‍යක්ෂ ජනරාල්, පේෂකර්ම හා ඇඟලුම් ආයතනය	කාලය හා ආතති කළමනාකරණය
ආර්. එම්. එස්. පී. රත්නායක මහතා, රථ වාහන පොලීසිය, බම්බලපිටිය	මාර්ග ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන
ඩේවිඩ් බැක්ස්ටර් මහතා විශේෂඥ USAID	රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වය
ආචාර්ය පී.ඒ.කිරිවන්දෙණිය මහතා, හිටපු සභාපති සණස සංවර්ධන බැංකුව	ප්‍රාදේශීය සංවර්ධනය සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය
ඩබ්. සී. ධීරසේකර මහතා - External Collaborator - ජාත්‍යන්තර ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය (IFPRI) ශ්‍රී ලංකා සහ හිටපු ලේකම් - කර්මාන්ත අමාත්‍යාංශය	පළාත් සභා හරහා ආහාර වටිනාකම දාම සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම
ලක්ෂමන් ජයසේකර මහතා, ව්‍යාපෘති අධ්‍යක්ෂ, බස්නාහිර පළාත් නගර සැලසුම් ව්‍යාපෘතිය	බස්නාහිර පළාත් නගර සැලසුම් ව්‍යාපෘති පිළිබඳ දළ විශ්ලේෂණයක්

වෛද්‍යා තමරා බෝගොඩ මිය.	ආයුර්වේදය සමග සෞඛ්‍ය සම්පන්න ජීවිතයක්
මහාචාර්ය එස්.පී. ප්‍රේමරත්න මයා, ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්ව විද්‍යාලය	ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික ගැටළු
මහාචාර්ය දියනාත් සමරසිංහ මයා මනෝ වෛද්‍යා උපදේශක.	මුදල් හා සෞඛ්‍ය

11.4. කාර්ය මණ්ඩල අධ්‍යයන

මුදල් කොමිෂන් සභාවේ නිලධාරින් විසින් ඔවුන්ට පැවරී ඇති රාජකාරි යටතේ සිදු කළ වැඩිදුර අධ්‍යයනයන් පදනම් කරගෙන ඉදිරිපත් කිරීම් සිදු කර ඇත.

11.5. මුදල් කොමිෂන් සභාවේ දත්ත පද්ධතිය හා කළමනාකරණ තොරතුරු පද්ධතිය පිළිබඳ ඉදිරිපත් කිරීම හා සාකච්ඡාව

මුදල් කොමිෂන් සභාවේ ආරාධනය අනුව, ආසියා පදනමේ විධායක අධ්‍යක්ෂ ඒ. සුභාකරන් මහතා සහ ඔහුගේ සම්බන්ධිකාරක විසින් ආසියා පදනමේ මූල්‍ය සහයෝගය ඇතිව උතුරු පළාත විසින් දැනට සංවර්ධනය කර ඇති කළමනාකරණ තොරතුරු පද්ධතිය පිළිබඳ ඉදිරිපත් කිරීමක් කරන ලදී.

12. ස්වාධීන කොමිෂන් සභා සම්බන්ධ කටයුතු පිළිබඳ රැස්වීම

2018 පෙබරවාරි මස 02 දින ජනාධිපති ලේකම් ඔස්ටින් ප්‍රනාන්දු මහතාගේ ආරාධනයෙන් කොමිෂන් සභාවන්හි නියෝජිතයින් සමග ජනාධිපති ලේකම් කාර්යාලයේදී රැස්වීමක් පවත්වන ලදී. මුදල් කොමිෂන් සභාවේ ලේකම් ද එම රැස්වීමට සහභාගිවන ලදී.

මෙම රැස්වීමේ අරමුණ වූයේ සියළුම නියෝජිතයින් හට ඔවුන්ගේ ගැටළු සාකච්ඡා කිරීමට හා අවශ්‍ය නිර්දේශ ලබාගැනීම සඳහා අවස්ථාව ලබාදීමයි.

13. ඒකාබද්ධ ක්ෂේත්‍ර චාරිකාව - දොරොව්ව ගමේ පිහිටි ප්‍රජා ජල සම්පාදන යෝජනා ක්‍රමය

බස්නාහිර පළාතේ සහ මුදල් කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් ගම්පහ දිස්ත්‍රික්කයේ දොරොව්ව ගම්මානයේ ක්ෂේත්‍ර නිරීක්ෂණ චාරිකාවක නිරත විය. ප්‍රජා ජල සම්පාදන යෝජනා ක්‍රමය යටතේ ජල සැපයුම් ටැංකි ඉදිකර ඇත. ව්‍යාපෘතිය සඳහා විකල්ප ජල ප්‍රභවයක් තිබිය යුතු යැයි හඳුනාගෙන ඇති අතර, මෙම ගැටළුව සඳහා විධිමත් විසඳුමක් සොයා ගැනීම සඳහා බස්නාහිර පළාත් සභාව තීරණය කර තිබේ.

14. පළාත් ආදායම් කොමසාරිස්වරුන් සහ පළාත් ප්‍රවාහන අංශයේ නිලධාරීන් සමග රැස්වීම්

2018 අප්‍රේල් මස 02 වන දින පළාත් ප්‍රවාහන අංශයේ නිලධාරීන් සහ පළාත් ආදායම් කොමසාරිස්වරුන් සමග රැස්වීම් දෙකක් මුදල් කොමිෂන් සභාවේ දී පැවැත්විණි. මෙම රැස්වීම්වල අරමුණ වූයේ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා පළාත් ප්‍රවාහන හා ආදායම් අංශයේ පවතින ගැටළු පිළිබඳ සාකච්ඡා කිරීමට සියලු නියෝජිතයින් හට අවස්ථාව ලබා දීමයි.

15. මුදල් කොමිෂන් සභාවේ ප්‍රතිපත්ති නිර්දේශ කිරීම පිළිබඳ සාකච්ඡාව - 2018

ජනාධිපති ලේකම් විසින් මුදල් කොමිෂන් සභාවේ 2018 වර්ෂයේ නිර්දේශ පිළිබඳ සාකච්ඡාවක් 2018 මැයි මස 23 වන දින ජනාධිපති ලේකම් කාර්යාලයේ දී පවත්වන ලදී. මෙම රැස්වීම සඳහා මුදල් කොමිෂන් සභාවේ සාමාජිකයින් සහ නිලධාරීන්, ප්‍රධාන ලේකම්වරුන් සහ අනෙකුත් අදාල රේඛීය අමාත්‍යාංශවල ලේකම්වරුන් සහභාගීවන ලදී. මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ සාකච්ඡා කිරීමෙන් පසු, ප්‍රධාන ලේකම්වරුන් විසින් මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද ගැටළු පිළිබඳව ද සාකච්ඡා කරන ලදී.

16. කළුතර දිස්ත්‍රික් ක්ෂේත්‍ර චාරිකාව කණේවෙල ඇළ මාර්ගය සහ කෘෂි කාර්මික ව්‍යාපෘති (යහපත් කෘෂි කාර්මික පුරුදු (GAP))

මුදල් කොමිෂන් සභාවේ හා බස්නාහිර පළාත් නිලධාරීන් කණේවෙල ඇළ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සහ විවිධ කෘෂිකාර්මික ව්‍යාපෘතිවල (යහපත් කෘෂිකාර්මික පුරුදු (GAP)) ප්‍රගති සමාලෝචනය සඳහා කළුතර දිස්ත්‍රික්කයේ ක්ෂේත්‍ර චාරිකාවක නිරත විය. මෙම චාරිකාවේ දී විවිධ ගැටළු හඳුනාගත හැකි විය. මෙම ගැටළු සාකච්ඡා කිරීම සඳහා අදාල වගකිව යුතු පාර්ශව සමග විශේෂ රැස්වීමක් 2018.06.25 වන දින පැවැත්විණි. මෙම රැස්විම සඳහා බස්නාහිර පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්), බස්නාහිර පළාත් කෘෂිකර්ම

අමාත්‍යාංශයේ ලේකම්, කෘෂිකර්ම හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂවරු සහ බස්නාහිර පළාතේ අනෙකුත් වගකිව යුතු නිලධාරීන් සහ අපනයන සංවර්ධන මණ්ඩලයේ නියෝජිතයෙකු සහභාගි විය.

17. බස්නාහිර පළාතේ මහ නගර සභා හා නගර සභා සම්බන්ධ කටයුතු පිළිබඳ හමුව

බස්නාහිර පළාතේ මහ නගර සභා හා නගර සභා නගරාධිපතිවරුන්, කොමසාරිස්වරුන් සහ ලේකම්වරුන් සමඟ සාකච්ඡාවක් 2018 ජූලි මස 19 වැනි දින මුදල් කොමිෂන් සභාවේදී පවත්වන ලදී.

මෙම රැස්වීමේ අරමුණ වූයේ බස්නාහිර පළාතේ සියළුම මහ නගර සභා හා නගර සභා මුහුණදෙන ප්‍රශ්න සහ ගැටලු සාකච්ඡා කිරීම හා සුදුසු ප්‍රතිපත්ති තීරණ ගැනීමට නියෝජිතයින් හට අවස්ථාව ලබා දීමයි.

18. ආර්ථික සභාව සමග රැස්වීම

2018 ජූලි මස 05 වන දින මුදල් කොමිෂන් සභාවේ සභාපති, ලේකම් ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කිහිපදෙනෙකුගේ සහභාගීත්වයෙන් ජනාධිපති ලේකම් කාර්යාලයේදී ජාතික ආර්ථික සභාවේ (NEC) මහ ලේකම් මහාචාර්ය ලලිත් සමරකෝන් මහතා එලදායී සාකච්ඡාවක් පවත්වන ලදී.

ජාතික ආර්ථික සභාවේ මහලේකම්වරයා විසින් මුදල් කොමිෂන් සභාව විසින් සිදු කරන ලද කාර්යභාරය අගය කළ අතර, මුදල් කොමිෂන් සභාවේ කාර්යභාරය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටින ලදී. එම වාර්තාව 2018 ජූලි මස 23 දින ජාතික ආර්ථික සභාව (NEC) වෙත ඉදිරිපත් කර ඇත.

19. ජාතික හා උප ජාතික මට්ටමේ සංවර්ධනය සඳහා පොදු සැලසුම් රාමුව

ජාතික සහ උප මට්ටම් සංවර්ධනය සඳහා පොදු සැලසුම්කරණ ආකෘතියක් ඇති කිරීම සඳහා මුදල් කොමිෂන් සභාව කටයුතු කරයි. ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන් හා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමග ජනාධිපති ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමක දී මෙම විෂය සාකච්ඡාවට භාජනය කෙරිණි.

ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් 2018 සැප්තැම්බර් මස 19 දින මුදල් කොමිෂන් සභාවේ සභාපති, ලේකම් සහ නිලධාරීන් තුන් දෙනෙකු සමග රැස්වීමක් සංවිධානය කරන ලද අතර, රේඛීය අමාත්‍යාංශවල අනෙකුත් අදාළ නිලධාරීන් ද මෙම රැස්වීමට සහභාගි වන ලදී.

20. 2018 අයවැය හි සඳහන් ගැටළු සහ 2019 වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදන පිළිබඳ රැස්වීම

ප්‍රධාන ලේකම්වරුන් සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් (මුදල්) සමග 2019 ඔක්තෝබර් මස 05 වන දින මුදල් කොමිෂන් සභාවේ දී රැස්වීමක් පවත්වන ලදී. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ද මේ සඳහා සහභාගී විය.

මෙම රැස්වීමේහී ප්‍රධාන අරමුණ වූයේ, 2018 පළාත් අයවැය හා 2019 වර්ෂය සඳහා ප්‍රතිපාදනයන් වෙන් කිරීම පිළිබඳ ගැටලු සාකච්ඡා කිරීම හා නිර්දේශයන් ඉදිරිපත් කිරීමට ප්‍රධාන ලේකම්වරුන්ට අවස්ථාව ලබා දීමයි.

21. වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීම පිළිබඳ රැස්වීම - 2019

මුදල් කොමිෂන් සභාව විසින් සංවිධානය කරන ලද 2019 වර්ෂය සඳහා අයවැය වෙන් කිරීම, මාර්ගෝපදේශ හා වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීම (අංශ, සංරචක සහ උප සංරචක) සඳහා විශේෂ රැස්වීමක් 2018 ඔක්තෝම්බර් මස 16 වන දින පවත්වන ලදී. මෙම රැස්වීම සඳහා සියලුම පළාත්වල නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් (සැලසුම්) සහභාගි වූහ.

22. තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ළඟා කර ගැනීම සඳහා ආහාර වටිනාකම් දාම සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් ආහාර තාක්ෂණික උද්‍යාන සංවර්ධනය කිරීම පිළිබඳ දෙදින ජාතික වැඩමුළුව

තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ළඟා කර ගැනීම හා පළාත් සභා සඳහා අරමුදල් වෙන් කිරීම පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම තුළින් සමාජ ආර්ථික විෂමතා අඩු කරලීම මුදල් කොමිෂන් සභාවේ ප්‍රතිපත්ති සම්පාදනයේ අරමුණ වේ.

ශ්‍රී ලංකාවේ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ළඟා කර ගැනීම උදෙසා ආහාර වටිනාකම් දාම සංවර්ධනය කිරීමේ යෝජනා ක්‍රියාත්මක කිරීම තුළින් පළාත් ආහාර තාක්ෂණික උද්‍යාන සංවර්ධනය කිරීමට පාර්ශවකරුවන්ගේ අදහස් ලබාගැනීම සඳහා මාණ්ඩලික නිළධාරීන් විසින් දින දෙකක ජාතික වැඩමුළුවක් සංවිධානය කිරීමට සැලසුම් කර ඇත.

අපේක්ෂිත දෙදින වැඩමුළුව ජනාධිපති ලේකම් කාර්යාලයත්, ශ්‍රී ලංකා මුදල් කොමිෂන් සභාව, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය හා ආසියානු පදනම සමඟ සහයෝගයෙන් එක්ව සංවිධානය කරනු ලබයි. මෙම වැඩමුළුව 2019 දී පැවැත්වීමට නියමිතව ඇත.

23. වෛද්‍ය පරිපාලන ක්ෂේත්‍රයේ වෛද්‍යවරුන්ගේ අධ්‍යයන චාරිකා

මුදල් කොමිෂන් සභාවේ කාර්යභාරය හා කාර්යයන් පිළිබඳව අධ්‍යානය කිරීම සඳහා දිවයිනේ විවිධ ප්‍රදේශවලින් පැමිණි වෛද්‍ය පරිපාලන ක්ෂේත්‍රයේ වෛද්‍යවරුන් කණ්ඩායමක් මුදල් කොමිෂන් සභාව වෙත පැමිණෙන ලදී. පළාත් පාලන විෂය සම්බන්ධ නිර්දේශ ක්‍රියාවලිය, සැලසුම්කරණය හා අයවැය ක්‍රියාවලිය සම්බන්ධ විෂයයන් සම්බන්දව ඉදිරිපත් කිරීමක් කරන ලදී. පළාත්වලට ලබා දුන් ප්‍රදාන, පළාත්වල ආදායම් ප්‍රභවයන්, පළාත් පාලන ආයතන සහ පළාත්වල අරමුදල් සම්පාදනය යනාදිය පිළිබඳව මෙම සංචාරයේ දී සාකච්ඡාවට භාජනය විය.

24. සමාජ-ආර්ථික දර්ශක සහ තුලිත ප්‍රාදේශීය සංවර්ධනය මැනීම පිළිබඳ සාකච්ඡාව

මුදල් කොමිෂන් සභාව විසින් සංවිධානය කරන ලද සාකච්ඡාවක් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව හා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව නියෝජනය කළ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් 2018 දෙසැම්බර් මස 05 වන දින මුදල් කොමිෂන් සභාවේදී පැවැත්විණ. පළාත් අතර විෂමතාවයන්ගේ ස්වභාවය හඳුනා ගැනීම සඳහා කමිටුවක් පිහිටුවා මනා අධ්‍යයනයක් තුළින් ප්‍රාදේශීය විෂමතාවයන් අවම කිරීම සඳහා වන ක්‍රමෝපායන් ඉදිරිපත් කිරීම පිළිබඳ සාකච්ඡා කිරීම එහි ප්‍රධාන අරමුණු විය.

මෙම රැස්වීමේදී සාකච්ඡා කළ පරිදි, එහි කාර්යභාරයන් කෙටුම්පත් කර නිරීක්ෂණයන් සහ අදහස් ලබාගැනීම සඳහා රැස්වීමට සහභාගී ආයතනයන් වෙත 2018 දෙසැම්බර් මස 12 වන දින ඉදිරිපත් කරන ලදී.

25. සහභාගී වීම / පැමිණි සම්මන්ත්‍රණ සහ වැඩමුළුව

මුදල් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ තෝරාගත් පිරිසකට ශ්‍රී ලංකාවේ නගර, පළාත් සංවර්ධන ආධාර ව්‍යපෘති, ප්‍රාථමික සෞඛ්‍ය සේවා, තිරසාර සංවර්ධනය අරමුණු, මූල්‍ය රෙගුලාසි, රාජ්‍ය ගිණුම්, පූර්ව ළමාවිය සංවර්ධනය, අන්තර් පළාත් සම්බන්ධීකරණ ආදි කරුණු පිළිබඳ සම්මන්ත්‍රණ සඳහා සහභාගී වූහ.

26. අභ්‍යන්තර විගණන කමිටුව

මුදල් කොමිෂන් සභාව විසින් කළමනාකරණ හා විගණන කමිටුවක් ස්ථාපිත කර ඇති අතර එහි රැස්වීම් වාර හතරක් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ විගණන අධිකාරීවරයාගේ සහ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂකවරයාගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී. අවශ්‍ය පසු විපරම් කටයුතු සඳහා රැස්වීමේදී ගනු ලැබූ තීරණයන් මුදල් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය වෙත දැනුම් දෙන ලදී. අභ්‍යන්තර විගණනය අදාල කටයුතු විධිමත් කිරීමට අමතරව කාර්යසාධනය උදෙසාද විය යුතු බව කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදී.

27. ජාතික විගණන පනත

2018 ජූලි මාසයේ දී ජාතික විගණන ආඥාපනතේ විධිවිධාන කොමිෂන් සභාව විසින් සලකා බලන ලද අතර එහි විධිවිධාන අනුව ජාතික විගණන පනත සහ අභ්‍යන්තර විගණනයේ යහපාලනය පිළිබදව කොමිසම් සභාව වෙත අනු කමිටුව මගින් වාර්තා කරනු ඇත.

28. ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනය සමග සහයෝගීතාවයෙන් ඒකාබද්ධ පර්යේෂණ අධ්‍යනය

මුදල් කොමිෂන් සභාව සහා ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනය සමග ඒකාබද්ධව පළාත් පාලනය හා පළාත් සභා ක්‍රමය පිළිබද පර්යේෂණ කටයුතු සිදු කිරීමට කටයුතු ආරම්භ කර ඇත.

මෙම ප්‍රයත්නය තුළින්, මුදල් කොමිෂන් සභාවේ නිලධාරීන්ගේ පර්යේෂණ ක්ෂේත්‍රයේ ධාරිතාව වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ. මෙම ප්‍රයත්නය ඉදිරියට ගෙන යාම සඳහා අවබෝධතා ගිවිසුමක් පිළියෙල කර 2018 නොවැම්බර් මස 30 වන දින ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනය වෙත එය තවදුරටත් සංවර්ධනය හා අවසන් කිරීම සඳහා යවා ඇත.

29. මුදල් කොමිෂන් සභාවේ කාර්යසාධන වාර්තාව

2018 වර්ෂයේ පළමු හා දෙවන කාර්තුව සදහා කාර්ය සාධන වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර තුන්වන කාර්තුවේ කාර්ය සාධන වාර්තාව ව්‍යවස්ථාදායක සභාවට ඉදිරිපත් කරන ලදි.

30. ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන්ගේ කාර්ය සාධන ඇගයීම

2017 දී කොමිෂන් සභාව විසින් සම්මත කරන ලද පාලන සංග්‍රහයේ විධිවිධාන අනුව, ප්‍රධාන විධායක නිලධාරීන් (ලේකම්) සහ සෙසු ජ්‍යෙෂ්ඨ කළමනාකරණ නිලධාරීන්ගේ (අධ්‍යක්ෂ මණ්ඩලයේ) කාර්ය සාධනය කොමිෂන් සභාවේ අනු කමිටුව විසින් ඇගයීමට ලක් කරන ලද අතර, ඔවුන්ගේ වාර්තාව 2018 නොවැම්බර් මාසයේදී කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදී. කොමිෂන් සභාවේ ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා කාර්තුමය පදනම මත ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය ඇගයීමට කොමිෂන් සභාව අදහස් කරගෙන සිටී.

31. වැඩ අධ්‍යනය

මුදල් කොමිෂන් සභාව විසින් ගන්නා ලද තීරණයන් අනුව වඩාත් ඵලදායී හා කාර්යක්ෂම ලෙස කාර්යභාරය ඉටු කිරීම පිණිස කාර්ය මණ්ඩල අවශ්‍යතා හඳුනාගැනීම සඳහා වැඩ අධ්‍යනයක් සිදු කිරීමට අපේක්ෂා කර ඇත.

අධ්‍යනයනයේ මූලික අරමුණ වන්නේ කොමිෂන් සභාව තුළ මානව සම්පත හා තාක්ෂණය උපයෝගී කර ගනිමින් එක් එක් ක්‍රියාකාරිත්වයන් සම්බන්ධයෙන් දැඩි අධ්‍යයනයක් කිරීමෙන් ආයතනයේ ඵලදායිතාව වැඩිදියුණු කිරීමයි.

32. විශේෂ අධ්‍යයනයන්

මුදල් කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම් සඳහා විශේෂ අධ්‍යයනයන් රාශියක් සිදු කරන ලදී. ඒවාට ඇතුළත් වන්නේ:

- අරමුදල් බෙදා වෙන් කිරීම සඳහා නව සංඛ්‍යානමය ක්‍රමවේදය සංවර්ධනය කිරීම
- ශ්‍රී ලංකාවේ අන්තර් රාජ්‍ය මූල්‍ය සම්බන්ධතා
- ශ්‍රී ලංකාවේ පළාත් ආදායම්
- පළාත් පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීම
- පළාත් සභා, පළාත් අධිකාරි සහ පළාත් පාලන අධිකාරීන්හි සේවක සංඛ්‍යාව
- නඩත්තු වියදම් පිරිවැය නැවත අය කිරීම
- ජාතික සහ පළාත් මට්ටම අතර සෞඛ්‍ය අංශයේ වියදම් සංසන්දනය කිරීම
- ජාතික හා පළාත් මට්ටම අතර අධ්‍යාපන අංශයේ වියදම් සංසන්දනය කිරීම
- රජයේ සිට පළාත් සභා දක්වා ආදායම් බෙදා හැරීම
- පළාත් සභා වෙත අනුයුක්ත කරන ලද රේඛීය අමාත්‍යාංශ (අධ්‍යාපන) කාර්ය මණ්ඩලය තක්සේරු කිරීම - 2019
- ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයෙහි පෞද්ගලික අංශයේ සහභාගීත්වය - 2017
- ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා පෞද්ගලික අංශයේ සහභාගිත්වය
- රේඛීය අමාත්‍යාංශයන් හී අයවැය ප්‍රතිපාදන පළාත් අතර බෙදා හැරීම් පිළිබඳ අධ්‍යයනය
- අභ්‍යන්තර ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටිය

33. කාර්යමණ්ඩල බඳවා ගැනීම

මුදල් කොමිෂන් සභාව සඳහා සහකාර අධ්‍යක්ෂවරයෙකු, නව පත්වීම් ලද රාජ්‍ය කළමනාකරණ සහකාරවරුන් හතර දෙනෙකු හා අභ්‍යාසලාභී උපාධිධාරීන් පස්දෙනෙකු අනුයුක්ත කරන ලද අතර පරිපාලන නිලධාරිවරියක්ද පත් කරන ලදී.

34. මුදල් කොමිෂන් සභාවේ මූල්‍ය කාර්ය සාධනය

මුදල් කොමිෂන් සභාවේ මූල්‍ය කාර්යසාධනය මුදල් කොමිෂන් සභාව විසින් මාසිකව සමාලෝචනය කරනු ලබයි.

35. මුදල් කොමිෂන් සභාවේ අනුකූලතා වාර්තාව

මුදල් කොමිෂන් සභාව විසින් එහි ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය සියලු අනුකූලතා ඉටුකර ඇති බව සහතික කරයි. මේ සම්බන්ධයෙන් අනුකූලතා වාර්තා මාසිකව කොමිෂන් සභාවට ඉදිරිපත් කරනු ලැබේ.

36. ආංශික අධ්‍යයනයන්

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) සඳහා කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ ආංශික පදනමක් ද සහිතව ඉදිරිපත් කරයි. මේ සම්බන්ධයෙන් මුදල් කොමිෂන් සභාව සෞඛ්‍ය, අධ්‍යාපනය, වාරිමාර්ග, කෘෂිකර්මය සහ සමාජ සේවා වැනි අංශ සඳහා අධ්‍යනයන් කිහිපයක් ආරම්භ කර ඇත. ඒවා අතිගරු ජනාධිපතිතුමන් වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමේදී මෙන්ම පළාත්වලට අරමුදල් වෙන් කිරීම සඳහා ද භාවිතා කරනු ලැබේ.

37. ප්‍රාදේශීය සංවර්ධනය සඳහා මාධ්‍ය භාවිතය

දිනපතා ජාතික පුවත්පත්වල පළ කරන ලද මාධ්‍ය වාර්තා පිළිබඳව කොමිෂන් සභාව අවධානය යොමු කර ඇත. මීට අමතරව පළාත් පාලන ආයතන සහ පළාත් සභාවලට අදාලව දිනපතා හඳුනාගනු ලබන ප්‍රශ්න සහ ගැටළුවලට අදාල මාධ්‍ය ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ (SLBC) සිංහල ජාතික සේවය සමග මූලික සාකච්ඡාවක් කොමිෂන් සභාව විසින් පවත්වන ලදී.

මීට අමතරව ඩේලි නිවුස් පුවත්පතෙහි ඉස්මතු කර ඇති ප්‍රවෘත්ති හා හැන්සාඩ් වාර්තාවේ පළ වී ඇති අදාල කරුණු පිළිබඳව ද අවධානය යොමුකර ඇත.

38. 2015 වර්ෂයේ සිට 2018 දක්වා කාලය තුළ කොමිෂන් සභාවේ ක්‍රියාකාරිත්වය

මෑතකදී ස්වාධීන කොමිෂන් සභාවලට එරෙහිව නැගී ඇති චෝදනා සමහරක් මුදල් කොමිෂන් සභාව විසින් සැලකිල්ලට ලක්කරන ලදී. ඒ අනුව, කොමිෂන් සභාවේ මෑත කාලීන වසර තුනක කාර්ය සාධනය පිළිබඳව ජනමාධ්‍යවල ප්‍රවෘත්ති පළ කිරීමට කොමිෂන් සභාව තීරණය කර ඇත.

මෙම පුවත් නිකුතුව ලංකා ඩේලි නිව්ස්, ෆයිනෑන්ෂල් ටයිම්ස් සහ සන්ඩේ ඔබ්සර්වර් පුවත්පතෙහි පළ විය.

39. මුදල් කොමිෂන් සභාවේ මෙහෙයුම් කාර්ය සංග්‍රහය

මුදල් කොමිෂන් සභා රැස්වීම්වල නිර්දේශ මත පදනම්ව මුදල් කොමිෂන් සභාවේ මෙහෙයුම් කාර්ය සංග්‍රහය සකස් වෙමින් පවතී. මෙම මෙහෙයුම් කාර්ය සංග්‍රහය ප්‍රධාන අංශ තුනකින් සමන්විත වේ. එනම් (i). මූල්‍ය කළමනාකරණය සඳහා පද්ධති හා ක්‍රියාපටිපාටි, (ii). අවශ්‍යතා තක්සේරු ක්‍රියාපටිපාටි හා (iii). මුදල් කොමිෂන් සභා කාර්යාලයේ පොදු පරිපාලන ක්‍රියාපටිපාටි නම් වේ. මෙයට අමතරව මුදල් කොමිෂන් සභාවේ කාර්යයන් සරල කිරීම සඳහා වෙනම අභ්‍යන්තර ප්‍රතිපත්ති කාර්ය සංග්‍රහයක් සකස් වෙමින් පවතී.

40. කොමිෂන් රැස්වීම් / විධායක නිලධාරීන්ගේ රැස්වීම් / කාර්ය මණ්ඩල රැස්වීම්

- කොමිෂන් සභා රැස්වීම් 12 ක් පවත්වන ලදී.
- කොමිෂන් සභා අනු කමිටුව සෑම කොමිෂන් සභා රැස්වීමකටම පෙර රැස්විය.
- සතිපතා විධායක නිලධාරීන්ගේ රැස්වීම් අඛණ්ඩව පැවැත්විණි.
- කාර්ය මණ්ඩල රැස්වීම් අඛණ්ඩව පවත්වන ලදී.

41. මුදල් කොමිෂන් සභාව සඳහා අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම

2018 වර්ෂය සඳහා මුදල් කොමිෂන් සභාවේ පුනරාවර්තන වියදම් සඳහා රු. මිලියන 58.35 ක් වෙන් කරන ලද අතර, එම පුනරාවර්තන වියදම් භාවිතා කරන ලද ප්‍රතිශතය 96% කි. පුනරාවර්තන වියදමේ හි සැලකිය යුතු කොටසක් පුද්ගලික පඩිනඩි නියෝජනය කරයි. 2018 ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි නව වැටුප් ව්‍යුහයක් ක්‍රියාත්මක කිරීමත් සමග අතිකාල සහ වෙනත් දීමනා වැඩිවීමත් සමග පුද්ගලික පඩිනඩි තුළ සුළු වර්ධනයක් දක්නට ඇත. මුදල් කොමිෂන් සභාවට අලුතින් නිළධාරීන් බඳවා ගැනීම ද ඉහත වැඩිවීමට හේතුවී ඇත.

මුදල් කොමිෂන් සභාවේ ප්‍රාග්ධන වියදම් සඳහා රු. මිලියන 310.95 ක් වෙන් කරන ලද අතර, එමගින් රාජගිරියේ පිහිටි නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 286.85 ක් වෙන් කරන ලදී. ප්‍රාග්ධන වියදම් භාවිතා කිරීමේ ප්‍රතිශතය 70% කි.

2018 සහ 2017 වර්ෂ සඳහා අයවැය ප්‍රතිපාදන සහ සත්‍ය වියදම පහත වගුවේ දැක්වේ.

වැය විෂය	අයිතම විස්තරය	2018 (රු. 000)				2017 (රු. 000)			
		ඇස්තමේන්තුව	සත්‍ය වියදම	ඉතිරිය	සත්‍ය වියදම ඇස්තමේන්තුවේ % ලෙස	ඇස්තමේන්තුව	සත්‍ය වියදම	ඉතිරිය	සත්‍ය වියදම ඇස්තමේන්තුවේ % ලෙස
	පුනරාවර්තන වියදම්	**58,350**	**55,984**	**2,366**	**96%**	**50,160**	**48,278**	**1,882**	**96%**
	පුද්ගල පඩිනඩි	**35,100**	**33,853**	**1,247**	**96%**	**31,239**	**30,107**	**1,132**	**96%**
1001	වැටුප් හා වේතන	23,400	23,116	284	99%	16,935	16,082	853	95%
1002	අතිකාල හා නිවාඩු දින වැටුප්	600	579	21	97%	400	377	23	94%
1003	වෙනත් දීමනා	11,100	10,158	942	92%	13,904	13,648	256	98%
	ගමන් වියදම්	**630**	**604**	**26**	**96%**	**248**	**231**	**17**	**93%**
1101	දේශීය	200	174	26	87%	168	159	9	95%
1102	විදේශීය	430	430	0	100%	80	72	8	90%
	සැපයීම්	**3,640**	**3,517**	**123**	**97%**	**2,447**	**2,380**	**67**	**97%**
1201	ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා	1,100	1,099	1	100%	685	677	8	99%
1202	ඉන්ධන	2,250	2,130	120	95%	1,330	1,283	47	96%
1203	ආහාරපාන හා නිල ඇඳුම්	40	40	0	100%	25	24	1	96%
1205	වෙනත් සැපයුම්	250	248	2	99%	407	395	12	97%
	නඩත්තු වියදම්	**2,100**	**2,057**	**43**	**98%**	**2,116**	**2,116**	**0**	**100%**
1301	වාහන	1,500	1,468	32	98%	1,400	1,400	0	100%
1302	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	600	589	11	98%	711	711	0	100%
1303	ගොඩනැගිලි හා ඉදිකිරීම් නඩත්තුව	-	-	-	-	5	5	0	100%
	සේවා	**16,080**	**15,172**	**908**	**94%**	**13,310**	**12,689**	**621**	**95%**
1401	ප්‍රවාහන	3,300	3,240	60	98%	2700	2317	383	86%
1402	තැපැල් සහ සන්නිවේදන	1,500	1,364	136	91%	1,205	1,195	10	99%
1403	විදුලිය සහ ජලය	2,500	2,221	279	89%	1,725	1,567	158	91%
1404	බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු	1,320	1,320	0	100%	5,280	5,280	0	100%
1409	වෙනත් (සේවාවන්)	7,460	7,027	433	94%	2,400	2,331	69	97%
	මාරුකිරීම්	**800**	**782**	**18**	**98%**	**800**	**756**	**44**	**95%**
1506	**රාජ්‍ය සේවකයින් සඳහා දේපළ ණයපොලී**	800	782	18	98%	800	756	44	95%
	මූල්ධන වියදම්	**310,950**	**217,495**	**93,455**	**70%**	**102,900**	**87,838**	**15,062**	**85%**
	මූලධන වත්කම්වල පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම	**2,050**	**1,568**	**482**	**76%**	**800**	**701**	**99**	**88%**
2002	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	300	278	22	93%	300	205	95	68%
2003	වාහන	1,750	1,290	460	74%	500	497	3	99%
	මූල්ධන වත්කම් අත්පත් කර ගැනීම	**21,000**	**20,941**	**59**	**100%**	**1,200**	**1,145**	**55**	**95%**
2102	ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ	2,500	2,470	30	99%	330	312	18	95%
2103	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	18,500	18,470	30	100%	870	833	37	96%
	මානව සම්පත් සංවර්ධනය	**1,050**	**1,024**	**26**	**98%**	**900**	**863**	**37**	**96%**
2401	කාර්යමණ්ඩල පුහුණු	1,050	1,024	26	98%	900	863	37	96%
	ගොඩනැගිලි හා ඉදිකිරීම්	**286,850**	**193,963**	**92,887**	**68%**	**100,000**	**85,129**	**14,871**	**85%**
2104	ගොඩනැගිලි හා ඉදිකිරීම්	286,850	193,963	92,887	68%	100,000	85,129	14,871	85%

රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ විස්තර පහත පරිදි වේ. ඒ අනුව මුදල් කොමිෂන් සභාවේ නියමිත සීමාවන් තුළ අත්තිකාරම් බී ගිණුම මෙහෙයවා ඇත.

විස්තරය	2018 රු.		2017 රු.	
	අනුමත සීමාව	**සත්‍ය සීමාව**	**අනුමත සීමාව**	**සත්‍ය සීමාව**
උපරිම වියදම් සීමාව	3,200,000.00	2,999,593.50	3,200,000.00	4,110,390.00
අවම ලැබීම් සීමාව	1,000,000.00	1,923,284.07	800,000.00	2,213,017.65
උපරිම හර සීමාව	13,000,000.00	9,359,711.28	12,000,000.00	8,283,401.85